**මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය - 2013**

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2006 ජනවාරි 16 වැනි දින එළඹි අංක 4138 - සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------------

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ සංවර්ධන ණය ගිවිසුමට අනුව එවකට මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය (මමාසංඅ) සහ වර්තමාන මහාමාර්ග වරාය, හා නාවික අමාත්‍යාංශය (මවනාඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කාර්යක්ෂම ජාතික මාර්ග පද්ධතියක් තිරසාරව බෙදාහැරීම තුළින් ප්‍රවාහන පිරිවැය අඩුකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. සංවර්ධන ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 10,125 කට සහ එජඩො මිලියන 100 කට සමාන විගැහි 69,100,000 වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2008 ජූනි 23 දින එළඹි අංක 4429 සීඊ දරන පළමු අතිරේක සංවර්ධන ණය ගිවිසුම යටතේ රු. මිලියන 11,579 කට සහ එජඩො මිලියන 98.1 කට සමාන විගැහි 59,600,000 ක අතිරේක වෙන්කිරීමක් සපයා තිබුණි. මීට අමතරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය 2011 මාර්තු 15 දින අංක 4906 සීඊ දරන දෙවැනි අතිරේක සංවර්ධන ණය ගිවිසුමට එළඹි අතර රු. මිලියන 11,081 කට හා එජඩො මිලියන 100 කට සමාන විගැහි 63,600,000 ක අතිරේක වෙන් කිරීමක්ද ඒ මත සිදුකර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2006 ජනවාරි 16 දින මූලික වශයෙන් ආරම්භ කර තිබුණු අතර 2011 මාර්තු 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් දෙවැනි අතිරේක සංවර්ධන ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2014 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාත් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් සංවර්ධන ණය ගිවිසුම්වල නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක සහ අවසන් ශේෂ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේ ද යන බව හා

(ඒ) සංවර්ධන ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

3. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමින් ආපසු ගැනීම්, එම ගිණුමට ඌන පූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

4. මූල්‍ය ප්‍රකාශන

-----------------

4.1 මූල්‍ය කාර්ය සාධනය

--------------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 4,936,882,103 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 32,113,493,499 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ - පිරිවැය | 64,217,352 | 37,382,303 | 282,932,946 |
| සිවිල් වැඩ | - | - | 22,545,175,549 |
| කෙරීගෙන යන සිවිල් වැඩ | 468,184,471 | 2,935,852,461 | 3,476,245,967 |
| සැලසුම් උපදේශක සේවා | - | - | 122,604,638 |
| ව්‍යාපෘති හා වෙනත් උපදේශක සේවා | 22,327,897 | 18,616,519 | 127,557,404 |
| ඉදිකිරීම් අධීක්ෂණය | 667,713,673 | 17,215,520 | 684,929,194 |
| ව්‍යාපෘති වියදම් | 94,264,520 | 161,978,284 | 600,471,063 |
| පුහුණුව | 7,432,859 | 17,478,447 | 74,558,387 |
| උපයෝගීතා වෙනත් තැනකට ගෙන යාම | 186,319,135 | 7,084,035 | 501,676,989 |
| ශුද්ධ ජංගම වත්කම් | 3,426,422,196 | 332,379,261 | 3,697,341,362 |
| | 4,936,882,103 | 3,527,986,831 | 32,113,493,499 |

4.2 විශේෂ (ඩොලර්) ගිණුම්

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව ගිවිසුම් 03 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විශේෂ (ඩොලර්) ගිණුම් 03 ක් පවත්වාගෙන ගොස් තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් කටයුතු හා අදාළ ගිණුම්වල ශේෂ පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ණය අංකය | 4429 සීඑ | | 4906 සීඑ | | 4138 සීඑ | |
|---|---|---|---|---|---|---|
| | එජඩො | ශ්‍රීලංරු | එජඩො | ශ්‍රීලංරු | එජඩො | ශ්‍රීලංරු |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 9,113,859 | 1,158,925,538 | 377,195 | 47,964,399 | 560,768 | 71,307,692 |
| එකතු කළා | | | | | | |
| ඌන පූර්ණයන් | - | - | 34,735,300 | 4,425,946,399 | 1,436,203 | 181,305,441 |
| විදේශ විනිමය වාසිය | - | 6,579,837 | - | 120,202,275 | - | 5,302,768 |
| | 9,113,859 | 1,165,505,375 | 35,112,495 | 4,594,113,073 | 1,996,971 | 257,915,901 |
| අඩු කළා | | | | | | |
| ආපසු ගැනීම් | 7,930,387 | 1,010,762,966 | 14,464,036 | 1,894,265,046 | 1,682,903 | 216,850,615 |
| විදේශ විනිමය පාඩුව | | - | | - | | - |
| 2013 දෙසැ. 31 දිනට ශේෂය | 1,183,471 | 154,742,409 | 20,648,460 | 2,699,848,026 | 314,068 | 41,065,286 |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 224,228,425 කට ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් 2010 වර්ෂයේ සිට මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කරන ලද නමුත් වත්කම්වල ශුද්ධ වටිනාකම මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කිරීමෙන් තොරව අඛණ්ඩව ක්ෂය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) රු. 188,910,898 ක් සහ රු. 66,094,176 ක් වටිනා වත්කම් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසම්පාදනය කර පිළිවෙලින් මාර්ග සංවර්ධන අධිකාරියට හා මාර්ග නඩත්තු භාර අරමුදල (නභාඅ) වෙත භාර දී තිබුණි. මාරු කරන ලද වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලාභීන් යටතේ දක්වනු වෙනුවට රු. 31,365,750 ක, මුදලක් ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ යටතේ ක්ෂය වශයෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ඉංගිරිය - රත්නපුර මාර්ගයට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියට එරෙහිව පවරා තිබූ බේරුම්කරණ නඩුව හා සම්බන්ධ අසම්භාව්‍ය වගකීම සඳහා ප්‍රතිපාදන සැලසීම හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම හෝ කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී නිම කරන ලද වැඩවල වටිනාකම වූ රු. 3,303,631 ක උපචිත වියදම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියට සපයා තිබුණු ජීඅයි පයිප්පවලට ගෙවිය යුතු ඉතිරි මුදල වූ රු. 6,987,238 සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා දරන ලද දිරි දීමනා සහ පොදු කාර්ය වියදම් පිළිවෙලින් රු. 327,530 ක් සහ රු. 1,076,276 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි ව්‍යාපෘතිය විසින් එම අධිකාරියට ගෙවා තිබුණි. 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 සහ 8.6 ඡේදවල උපදෙස් ප්‍රකාරව එවැනි වියදම්

ව්‍යාපෘතියෙන් අයකර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියට හිමිකමක් නොමැති බව නිරීක්ෂණය විය.

## 6. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව ව්‍යාපෘති මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| මූල්‍යායන සැලැස්ම | විදේශ සංරචක යටතේ වෙන්කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|
| | එජඩො | රු | එජඩො | රු |
| | මිලියන | මිලියන | මිලියන | මිලියන |
| ජාසංසං<br>සංවර්ධන ණය අංක. | | | | |
| 4138 සීඊ | 100.0 | 10,125 | 74.1 | 9,642 |
| 4429 සීඊ | 98.1 | 11,579 | 82.9 | 10,775 |
| 4906 සීඊ | 100.0 | 11,081 | 35.4 | 4,597 |
| විනිමය වෙනස | - | - | 3.0 | 392 |
| ශ්‍රී ලංකා රජය | - | - | 51.6 | 6,707 |
| එකතුව | 298.1 | 32,785 | 247 | 32,114 |

### 6.2 කොන්ත්‍රාත් පරිපාලනය

අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය මාර්ගයේ (A 06) - කන්තලේ සිට ත්‍රිකුණාමලය නගරය දක්වා, කි.මී. 190 + 000 සිට කි.මී. 199 – 300 (KT 04) දක්වා කි.මී. 9.3 ක් පුනරුත්ථාපනය කිරීම.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ත්‍රිකුණාමලය සමුද්‍ර ප්‍රදේශයේ සහ කලපුව ප්‍රදේශයේ හා වටරවුමේ මීටරයක ආරක්ෂිත වැටක් සවිකිරීම සඳහා රු. 6,350,000 ක මුදලක් ප්‍රමාණ පත්‍රයේ ප්‍රතිපාදන සලසා තිබූ නමුත් රු. මිලියන 25.8 ක පිරිවැයක් දරමින් මීටර් 1723 ක් ස්ථාපිත කර තිබුණි. මීටර් 1723 න් මීටර් 1453 ක් හෙවත් සියයට 78 කට සමාන ප්‍රමාණයක් දෝෂ වගකීම් කාල

පරිච්ඡේදය තුළදී දිරාගොස් තිබූ බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය. එහෙත් දෝෂයන් නිවැරදි කර හෝ අළුත්වැඩියා පිරිවැය රඳවා ගැනීම් මුදල්වලින් අය කර හෝ නොතිබුණි. තවද අදාළ සැලසුම් සහ පිරිවිතර, ගුණාත්මක වැඩ සඳහා පරිපූර්ණ නොවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) සිංහල මහා විද්‍යාලයේ ආරක්ෂක බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ කපරාරු වැඩ පිළිබඳ විචලන නියෝග අංක 02 සඳහා රු. 450,000 ක මුදලක් ඇතුළත් කර තිබූ නමුත්, ආරක්ෂක බැම්මේ කපරාරු වැඩ සිදුකර නොතිබියදී එම කාර්යයද ඇතුළු වැඩ සඳහා රු. මිලියන 3.06 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) අයිපීසී අංක 16 න් සංඥා පුවරු 541 ක් සවිකිරීම සඳහා රු. 8,115,000 ක මුදලක් ගෙවා තිබුණු නමුත්, සංඥා පුවරු 480 ක් පමණක් සවිකර, නොකළ වැඩ සඳහා රු. 915,000 ක් ගෙවා තිබූ බව විගණන පරීක්ෂණයේ දී අනාවරණය විය.

6.3 කෙරීගෙන යන සිවිල් වැඩ
------------------------------

මැලිබන් හන්දිය සිට කුරුස හන්දිය දක්වා කි.මී.5.286 ක් සහ කොළඹ ගාල්ල - හම්බන්තොට - වැල්ලවාය මාර්ගයේ පානදුර පාලම සිට කුරුස හන්දිය දක්වා කි.මී.11.76 ක් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම අතිරේක ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 'ඉක්ටාඩ්' ආයතනයේ සම්මත ලංසු ලියවිල්ලේ 2 හා 6 වගන්ති, නිශ්චිත කොන්දේසි 14.2 සහ කොන්ත්‍රාත් කොන්දේසි 2 සහ 6 අනුව වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය යන්ත්‍ර, උපකරණ සහ සේවක මඬුල්ල ලබාගත හැකි බවට තහවුරු කර ගැනීම සඳහා සතුටුදායක සාක්ෂියක් වශයෙන් ලොට් අංක 01 සහ 02 සඳහා වෙනම විස්තරාත්මක වැඩ ආරම්භ කිරීමේ උපලේඛනයක් සැපයිය යුතුය. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් ලොට් අංක 01 සහ 02 යන වැඩ බිම් දෙක සඳහාම එක් උපලේඛනයක් පමණක් ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය වූ අතර ඉහත සඳහන් කොන්දේසිවලට පටහැනිව වැඩබිම් දෙක සඳහාම රු. 724,515,375 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් ලොට් අංක 01 ට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා වාහන, යන්ත්‍ර උපකරණ, ශ්‍රමය ආදී පවත්නා සම්පත් යොදවා තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු අවශ්‍ය සම්පත් සපයා තිබුණේ වැඩබිම් දෙක වෙනුවට එක් වැඩබිමක් සඳහා පමණි. කෙසේ වෙතත් ලොට් අංක 01 හා 02 කොන්ත්‍රාත් යටතේ වූ කොන්ත්‍රාත් ගිවිසුම් අනුව වැඩබිම් දෙකටම වෙන වෙනම අවශ්‍ය සම්පත් යොදවා එකවර නිමකළ යුතු විය. මෙසේ අවශ්‍ය සම්පත් සපයා නොතිබීම හේතු කොටගෙන සමාලෝචිත වර්ෂය තුළදී අපේක්ෂිත නිමකළ යුතු වැඩ ප්‍රමාණය වූ සියයට 28 වෙනුවට ලොට් අංක 02 හි වැඩ ප්‍රගතිය සියයට 7.8 ක් පමණක් විය.

(ඇ) තත්ත්ව සහතික සැලැස්මේ 7 වගන්තියේ 2,3,4,5,6 ඡේද අනුව වැඩබිමට සැපයූ ද්‍රව්‍ය ගුණාත්මක තත්ත්වයේ ඒවාද සහ වැඩයට ඒවා සුදුසුද යන්න ඇගයීමට පිළිගත හැකි නිශ්චිත මිණුම්, තත්ත්ව සහතික සැලැස්මේ ඇතුළත් කර නොතිබූ නිසා මාර්ග ඉදිකිරීම් වැඩවලට අදාළ ද්‍රව්‍යයන් සඳහා පිළිගත හැකි පාලන මිණුම් භාවිතා කර නොතිබුණි. තවද ඉහත සැලැස්මේ 13 වගන්තියේ උපදෙස් අනුව වැඩබිම් ලොට් අංක 01 හා 02 සඳහා මිලදී ගත් ද්‍රව්‍ය වෙන වෙනම ගබඩා කර නොතිබුණි.

(ඈ) තත්ත්ව සහතික සැලැස්මේ 16 වගන්තිය අනුව කොන්ත්‍රාත්කරු දෛනිකව ද්‍රව්‍ය පිළිබඳ නියැදි පරික්ෂාවක් කර අසමත් වීම් අනුකූල නොවන වාර්තාවේ සටහන් කළ යුතුය. කොන්ත්‍රාත්කරු දෛනිකව ද්‍රව්‍ය නියැදි පරික්ෂණ ක්‍රමය අනුගමනය කර තිබූ නමුත්, අනුකූල නොවීම් වාර්තා කිරීමේ ක්‍රමය අනුගමනය කර නොතිබුණි. ඒ අනුව නියැදි පරික්ෂාවේදී නිරීක්ෂණය වූ අසමත් වීම් කොන්ත්‍රාත්කරු නිවැරදි කළාද යන්න සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි නොතිබුණි. කොන්ත්‍රාත්කරු තත්ත්ව සහතික ක්‍රමය යොදා නොගත් නමුත් ව්‍යාපෘතියේ අධීක්ෂණ උපදේශක විසින් කාර්මික නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා ඒ සඳහා රු. 1,699,296 ක් ගෙවා තිබුණි.

6.4 උපදේශක සේවා ගෙවීම්

-----------------------------

ත්‍රිකුණාමලයේ පිහිටුවා ඇති ව්‍යාපෘති උපදේශක ඒකකය (ව්‍යාඋඒ) ප්‍රධාන කාර්ය මණ්ඩලය 17 කින් සහ සහායක කාර්ය මණ්ඩලය 25 කින් සමන්විත විය. සියයට 50 ක ව්‍යාපෘති දීමනාවක් හිමි කාර්ය මණ්ඩලයට ව්‍යාපෘතියෙන් අතිකාල දීමනා හිමිකම් නොමැති නමුත් සියයට 50 ක ව්‍යාපෘති

දීමනාව ලබාගත් නිලධාරීන්ට සමාලෝචිත වර්ෂය තුළදී රු. 909,159 ක් අතිකාල මුදල් ලෙස ගෙවා තිබුණි.

6.5 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

-------------------------------------

ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට 12 ක ප්‍රධාන කාර්ය මණ්ඩලයක් සහ 20 ක සහායක කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත බඳවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය, අභ්‍යන්තරව අයදුම්පත් කැඳවීම මඟින් තෝරා ගන්නා ලද තාවකාලික පදනම මත මාර්ග සංවර්ධන අධිකාරියෙන් නිදහස් කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත විය. කෙසේ වෙතත් 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.7 ඡේදය ප්‍රකාරව විදේශ අරමුදල් ව්‍යාපෘතිවලට කාර්ය මණ්ඩලය පත් කළ යුත්තේ එම විශේෂ තනතුරුවලට ඉතාම ප්‍රවීන පුද්ගලයන් පත්කර ගත හැකිවන පරිදි ප්‍රසිද්ධ නිවේදන පළකිරීම හරහා බවයි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 4.1.1 ඡේදය අනුව, රාජ්‍ය ආයතනවල නිලධාරීන් වැටුප් රහිත නිවාඩු මත පූර්ණ කාලීනව, කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘතියකට අනුයුක්ත කිරීමේ දී තමා දරන ස්ථිර තනතුරේ වැටුපෙන් සියයට 50 ක අතිරේක දීමනාවකට ඔවුන් හිමිකම් ලබයි. කෙසේ වෙතත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට හා ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයට මාර්ග සංවර්ධන අධිකාරියෙන් තාවකාලික පදනමක් මත මුදාහල නිලධාරීන් 34 දෙනෙකුට දීමනා වශයෙන් එකතුව රු. මිලියන 4.83 ක් ගෙවා තිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සේවය කරන කාලසීමාව වෙනුවෙන් අවස්ථානුරූප පාරිතෝෂික මුදලක් ව්‍යාපෘතිය විසින් ප්‍රතිපත්තියක් වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කරනු ලැබේ. කාර්යමණ්ඩල සාමාජිකයන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සේවය කරන ලද කාලසීමාව වෙනුවට ඔවුන්ගේ මාර්ග සංවර්ධන අධිකාරියේ සේවා කාලය ද ඇතුළත් කර සම්පූර්ණ සේවා කාලයම පදනම් කර ගෙන පාරිතෝෂික ගණනය කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින්,

2013 දෙසැම්බර් 31 දක්වා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 22 ක් වෙනුවෙන් රු. මිලියන 4.7 ක අතිරේක මුදලක් අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරිවරුන්, පරිපාලන නිලධාරීන් සහ දේශීය උපදේශකයින් වැනි ව්‍යාපෘතියේ විවිධ උසස් තනතුරු සඳහා කාර්ය මණ්ඩලය පසුගිය වර්ෂ 08 ඇතුළත වරින් වර බඳවා ගෙන තිබුණි. ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය පරිචයක් වශයෙන් එහි නිලධාරීන් ව්‍යාපෘති අත්දැකීම් සහ මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම පිණිස ව්‍යාපෘතියට පත්කරනු ලැබ ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘතියේ විධිමත් ක්‍රියාකාරීත්වය, කාලීනව ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘතිය පිළිබඳ සමීප අධීක්ෂණය සම්බන්ධයෙන් අඩු ප්‍රමුඛත්වයක් ලබා දී තිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ නමුත්, අතිරික්තව පරිගණක ක්‍රියාකරුවන් දෙදෙනෙකු අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පත්කර රු. 984,000 ක් ගෙවා තිබුණි.

6.6 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වත්කම් පිළිබඳව සමාලෝචිත වර්ෂය සඳහා භෞතික සත්‍යාපනය සිදුකර තිබූ නමුත් මාර්ග සංවර්ධන අධිකාරියට, මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශයට, පළාත් සභාවලට සහ මාර්ග නඩත්තු භාර අරමුදලට භාරදී තිබූ ස්ථාවර වත්කම් ව්‍යාපෘතිය විසින් සත්‍යාපනය කර නොතිබුණි.

6.7 මෝටර් වාහන උපයෝජනය

---------------------------------

ව්‍යාපෘතිය සේවා සපයන්නකු සමග මෝටර් වාහන 06 ක් කුලියට ගැනීම පිණිස ගිවිසුමකට එළඹ සමාලෝචිත වර්ෂය තුළදී රු. 3,799,600 ක් කුලී ගාස්තු ලෙස ගෙවා තිබුණි. එහෙත් මාසයක් තුළ ධාවනය සඳහා අනුමත කළ අවම කිලෝමීටර් ප්‍රමාණය ආවරණය කිරීම සඳහා එම වාහන ව්‍යාපෘතිය විසින් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව ධාවනය කිරීමට

එකඟ වූ අවම ප්‍රමාණයට වඩා කිලෝමීටර් 37,934 ක් අඩුවෙන් උපයෝජනය කර ඒ සඳහා රු. 814,317 ක් වාහන කුලී ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය තුළදී අතිරේක මෝටර් වාහන පිටතින් කුලියට ලබා ගෙන ඒ සඳහා රු. 394,002 ක මුදලක් ගෙවා තිබුණි.

6.8 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන චක්‍රලේඛයේ vii ඇමුණුමේ 5.6.14 උප වගන්තියේ දැක්වෙන ආකෘතියට අනුව ව්‍යාපෘතිය විසින් ණය සඳහා වූ ප්‍රතිපූර්ණ ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි.

7. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු, කළමනාකරණ වාර්තාවෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අවධානයට යොමු කරනු ලැබේ.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i) ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ කළමනාකරණය

(ii) වත්කම් කළමනාකරණය

(iii) කොන්ත්‍රාත් පරිපාලනය

(iv) ඉන්වෙන්ට්‍රි පාලනය